සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**10 - ශ්‍රේණිය**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය - I, II**

**නම/විභාග අංකය : ............................................................................ කාලය : පැය 03 යි.**

## I පත්‍රය

**උපදෙස් :**

- **සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 25 දක්වා ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා උත්තර පත්‍රයේ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ ' x' ලකුණ යොදන්න.**

01. ව්‍යාපාර අදහස හඳුනාගෙන එය යම් ප්‍රායෝගික ව්‍යාපාර කටයුත්තක් බවට පරිවර්තනය කිරීමේ හැකියාව,

1. කළමණාකරණය වේ.
2. ව්‍යවසායකත්වය වේ.
3. නිර්මාණශීලීත්වය වේ.
4. ව්‍යාපාරකරණය වේ.

02. ශ්‍රී ලංකාවේ 2019 වර්ෂයේ පාස්කු ඉරිදා සිදු වූ බෝම්බ ප්‍රහාරයෙන් පසු පාසල් සිසුන් වෙනුවෙන් විනිවිද ස්වභාවයෙන් යුතු පාසල් බෑග් නිපදවන වෙළෙඳපොළට යොමු කිරීම,

1. ලාභ චේතනාවෙන් සිදුකරන ලද්දකි.
2. තරඟකාරීත්වයට මුහුණ දීමකි.
3. ව්‍යවසායකත්වයේ ප්‍රතිපලයකි.
4. අධ්‍යාපනික අවශ්‍යතාවයක් ඉටු කිරීමකි.

03. ව්‍යවසායකයා,

1. නව්‍යතතා සම්පාදනයේ නිරත වේ.
2. සාම්ප්‍රදායිකව කටයුතු කරයි.
3. ඕනෑම අවදානමකට මුහුණ දේ.
4. ව්‍යාපාරික කටයුතු වල නිරත වෙයි.

04. ව්‍යවසායකත්වය යනු,

1. ශ්‍රම සම්පතේ කොටසකි.
2. ස්වාභාවික සම්පතකි.
3. මානව සම්පතකි.
4. තාක්‍ෂණික සම්පතකි.

05. පුද්ගලයකුට තම ජීවිතය පවත්වා ගෙන යාමේ දී අනිවාර්යෙන්ම සපුරාගත යුතු මූලික දෑ,

1. වුවමනා වේ.
2. අවශ්‍යතා වේ.
3. භාණ්ඩ හා සේවා වේ.
4. මුදල් වේ.

06. පහත දැක්වෙන ඒවා අතුරින් 'අවශ්‍යතාවයක්' වන්නේ කවරක් ද?

1. කමිස - කලිසම් 2. පොත් - පත්
3. ඇඳුම් - පැළඳුම් 4. ආප්ප - ඉදිආප්ප

07. සුනිමල් විදුලිය අඩුවෙන් වැයවන ආකාරයට LEDබල්බ යොදාගෙන වෙසක් තොරණක් නිපදවීම සුනිමල්ගේ,

1. නිර්මාණශීලීත්වයේ ප්‍රතිඵලයකි. 2. අභියෝග ජය ගැනීමකි.
3. අවදානම් සාර්ථක කර ගැනීමකි. 4. සමාජ පිළිගැනීම ඉහළ යාමකි.

08. විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම,

1. නිර්මාණශීලිත්වයට උත්තේජනයකි.
2. නිර්මාණශීලිත්වයට ශක්තියකි.
3. නිර්මාණශීලිත්වයට බාධාවකි.
4. නව්‍යතා සම්පාදනයට බාධාවක් නොවේ.

09. ව්‍යවසායකයා තමාගේම ස්වාමියා බවට පත්වීම,

1. අවදානම් දැරීම වේ. 2. ස්වාධීනත්වය වේ.
3. කළමනාකාරීත්වය වේ. 4. නායකත්වය වේ

10. ''ව්‍යාපාරික කටයුත්තක් සාර්ථක වීම හෝ අසාර්ථක වීම'' යනු,

1. අනාගතය වෙනස් කිරීමට යොමු වීමකි. 2. ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කිරීමකි.
3. ව්‍යවසායකයා අභියෝගවලට මුහුණ දීමකි. 4. අවදානමකට මුහුණ දීමකි.

11. ව්‍යවසායකයා අසාර්ථකත්වය සලකනු ලබන්නේ,

1. සම්පත් අපතේ යාමක් ලෙසටය. 2. අත්දැකීම් ලෙසටය.
3. අණුවනකම් ලෙසටය. 4. නොකලයුතුව තිබූ දෙයක් ලෙසටය.

12. ''අවශ්‍ය අවස්ථාවක දී මම මගේ තීරණ වෙනස්කර ගැනිමට පසුබට නොවෙමි'' මෙය ව්‍යවසායකයකුගේ කිනම් ගති ලක්ෂණයක් ද?

1. නිර්මාණශීලී බව 2. අධිෂ්ඨානශීලී බව
3. උපායශීලී බව 4. නම්‍යශීලී බව

13. බොහෝ අවස්ථාවල දී අලුත් දෙයක් කිරීමට ව්‍යවසායකයකුගේ යොමු වීම,

1. නිර්මාණශීලීත්වය වේ. 2. සුභවාදී වීම වේ.
3. අභියෝග ජයගැනීමක් වේ. 4. පරිසරයට අනුවර්තනය වීමක් වේ.

14. ''අලුත් දෙයක් කිරීමට ගොස් අපහසුතාවයට පත්වීමට වඩා පවතින දෙයක් කිරීම වඩාත් සුදුසු බව'' සිතන්නේ,

1. ව්‍යවසායකයකු වේ. 2. කළමනාකරුවකු වේ.
3. සංවිධායකවරයකු වේ. 4. සාම්ප්‍රදායික ව්‍යාපාරිකයකු වේ.

15. ''කුමන බාධක පැමිණිය ද මගේ අරමුණු ඉටුකර ගැනීම අත්නොහරිමි'' යනු ව්‍යවසායකයකුගේ,

| | | | |
|---|---|---|---|
| 1. | දැක්ම වේ. | 2. | අඛණ්ඩ උත්සාහය වේ. |
| 3. | කැපවීම වේ. | 4. | ඉවසීම වේ. |

16. ''ව්‍යාපාර පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ නිතර විමසිලිමත් වීම'' ව්‍යවසායකයකුගේ,

| | | | |
|---|---|---|---|
| 1. | පරිසර සංවේදීබව වේ. | 2. | පරිසර සංරක්ෂණය වේ. |
| 3. | ආචාරධර්ම කඩකිරීමක් වේ. | 4. | යහපත් ආකල්පයක් වේ. |

17. ව්‍යවසායකයකු නිතරම විශ්වාස කරන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | සේවකයින් සම්බන්ධවයි. | 2. | කළමනාකරුවන් සම්බන්ධවයි. |
| 3. | මූල්‍යායතන පිළිබඳවය. | 4. | තමා පිළිබඳවය. |

18. සෙසු පාර්ශවයන්ගේ බලපෑම්වලට ගැතිනොවී ව්‍යවසායකයකු ස්වයං පාලනයකින් යුතුව කටයුතු කිරීම,

| | | | |
|---|---|---|---|
| 1. | ප්‍රජාතාන්ත්‍රික බව වේ. | 2. | ස්වාධීනත්වය වේ. |
| 3. | නම්‍යශීලීත්වය වේ. | 4. | සමාන්‍ය වැටහීම වේ. |

19. ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට හිමිවන මූල්‍යමය ප්‍රතිලාභය වන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | ආදායම් වේ. | 2. | වැටුප් වේ. |
| 3. | ලාභ වේ. | 4. | කොමිස් වේ. |

20. ''ව්‍යවසායකයකු අනාගතයේ දී සැබෑකර ගැනීමට වෙරදරණ සිහිනය'' ඔහුගේ

| | | | |
|---|---|---|---|
| 1. | දැක්ම වේ. | 2. | අරමුණ වේ. |
| 3. | අධිෂ්ඨානය වේ. | 4. | කැපවීම වේ. |

21. සෑම සංවිධානයකටම පොදු ලක්ෂණයකි,

| | | | |
|---|---|---|---|
| 1. | වගකීම් සීමා සහිත වීම. | 2. | ලාභ ඉපයීම. |
| 3. | සම්පත් යොදවා තිබීම. | 4. | භෞතික ස්ථානයක් තිබීම. |

- පහත සඳහන් විස්තරය අනුව (22) හා (23) යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

''ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය නොලැබූ මූල්‍ය ආයතනයක් විසින් තැන්පතු සඳහා ඉහළ පොළී ප්‍රතිශතයක් ලබා දුන්නද ඇතැම් විට තැන්පත් කළ මුදල පවා නොලැබී යාමේ ඉඩකඩ තිබිය හැකිය.''

22. මුදල් තැන්පත්කරුවන්ගේ මූල්‍ය ප්‍රතිලාභය වන්නේ,

1. ආරක්ෂාව වේ.
2. ලාභාංශ ආදායම වේ.
3. පොළී ආදායම වේ.
4. තැන්පත් කළ මුදල ආපසු ලබා ගැනීමවේ.

23. ''තැන්පත් කළ මුදල පවා නොලැබී යෑමේ ඉඩකඩ තිබිය හැකිය'' යනු,

1. අවදානම් ඉහළ එකක් වන බවයි.
2. අවදානම් පහළ එකක් වන බවයි.
3. නීතිමය පිළිසරණක් නොමැති බවයි.
4. සදාචාරාත්මක වගකීමෙන් බැහැර වී ඇති බවය.

24. ව්‍යවසායකත්ව සංකල්පය හා බැඳුනු මූලික අදහසක් නොවන්නේ,

| | | | |
|---|---|---|---|
| 1. | නිර්මාණශීලීත්වය වේ. | 2. | නව්‍යතා සම්පාදනය වේ. |
| 3. | අවදානම් දැරීම වේ. | 4. | ලාභ උපරිම කිරීම වේ. |

25. අයිස්ක්‍රීම් බෙදාහැරීමේ ජංගම රථ ක්‍රමයටම බේකරි නිෂ්පාදන බෙදාහැරීම, නවෝත්පාදනය සිදුවන ආකාරයකි. මෙය,

| | | | |
|---|---|---|---|
| 1. | සංකලනයක් වේ. | 2. | අනුකරණයයක් වේ. |
| 3. | දිගුවක් වේ. | 4. | නව සොයා ගැනීමක් වේ. |

(ලකුණු 2x25=50)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

**10 - ශ්‍රේණිය**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය - II**

**නම/විභාග අංකය :** ..................................................................

## II පත්‍රය

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට සමත් භාණ්ඩ හා සේවා නව ආකාරයට ලබා දීමට ව්‍යවසායකයකු කටයුතු කරන අතර සාමාන්‍ය ව්‍යාපාරිකයකුට සාපේක්ෂව ව්‍යවසායකයකු තුළ සුවිශේෂ ගතිලක්ෂණ විද්‍යාමාන වේ. ව්‍යවසායකයා තමාට මෙන්ම සමාජයට ද යහපතක් ඉටුකරන අතර එය ව්‍යවසායකයාගේ අරමුණක් ද වේ.

ඉහත විස්තරයට අනුව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. 'මිනිස් අවශ්‍යතා' යන්න පැහැදිළි කරන්න.
2. මිනිස් අවශ්‍යතා වලට සාපේක්ෂව මිනිස් වුවමනාවල දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.
3. භාණ්ඩ හා සේවා අතර පවතින වෙනස්කම් දෙකක් ඉදිරිපත් කරන්න.
4. 'ව්‍යවසායකත්වය' යන්න ඔබ පැහැදිලි කරන්නේ කවර අන්දමින් ද?
5. පාරිභෝගිකයාට නිෂ්පාදන 'නව ආකාරයට' ලබාදීම සිදු කරන්නේ කවර ලෙසට ද? යන්න කරුණු දෙකකින් දක්වන්න.
6. ව්‍යවසායකයකු තුළ විද්‍යාමාන වන සුවිශේෂී ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
7. ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට අත්වන මූල්‍යමය නොවන ප්‍රතිලාභ හතරක් සඳහන් කරන්න.
8. ව්‍යවසායකයා විසින් සමාජ සුභසාධනයට දායක විය හැකි ආකාර දෙකක් ලියන්න.
9. ව්‍යවසායකත්වය තුළින් දේශීය ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ දෙකක් ඉදිරිපත් කරන්න.
10. ව්‍යවසායකයකු නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පෙර තම අවධානයට යොමු කළ යුතු කරුණු දෙකක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 2x10=20)

02. ''ගැටළු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව මාර්ග සොයාගැනීමට ඇති හැකියාව, නිර්මාණශීලීත්වය'' වේ.

1. පහත සඳහන් ගැටලු විසඳීමට යොදා ගත හැකි නිර්මාණශීලී විසඳුමක් බැගින් ඉදිරිපත් කරන්න.

    අ) ඔබේ පාසලේ හෝ ගෙවත්තේ කුණු කසල එක් රැස්වීම ඃ
    ආ) මදුරුවන් බෝ වීම

2. නිර්මාණශීලීත්වයට බාධාවන ආකාරයෙන් පුද්ගලයා තුළ හටගන්නා සිතුවිලි හෝ අදහස් වලින් දෙකක් ඉදිරිපත් කරන්න.

3. නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් ඉදිරිපත් කරන්න.

4. නිර්මාණශීලීත්වය තුළින් බිහි වී ඇති සන්නිවේදන උපකරණ දෙකක් නම් කරන්න.

5. නවෝත්පාදනය සිදුවන ආකාර දෙකක් නිදසුනක් සහිතව ඉදිරිපත් කරන්න.

(ලකුණු 2ඃ5=10)

03. විනෝදාංශයට සුරතල් මසුන් ඇති කිරීමට යොමුවූ රංජිත් යහළුවන්, අසල්වාසීන්ට සුරතල් මසුන් විකිණීම සිදුකර ලැබූ ආදායමින් තව තවත් සුරතල් මසුන් මිලදී ගනිමින්, තව තවත් මාළු බෝකරමින්, ටැංකි නිර්මාණයට යොමුවිය. ''- උත්සාහය හා කැපවීම තුළින් වෙළෙඳපොළ ජයගැනීම, රංජිත්ගේ ඉලක්කය වී තිබේ.''

1. රංජිත් ව්‍යවසායකයකු ලෙසට සැලකිය හැකි ද? පැහැදිළි කරන්න.

2. රංජිත් තුළින් විද්‍යාමාන වන ව්‍යවසායකත්ව ගති ලක්‍ෂණ දෙකක් ඉදිරිපත් කරන්න.

3. ව්‍යාපාරික කටයුතු වඩාත් සංවර්ධනය කර ගැනීම වෙනුවෙන් රංජිත්ට ලබාදිය හැකි යෝජනා දෙකක් ඉදිරිපත් කරන්න.

4. රංජිත් කුමන වර්ගයක ව්‍යවසායකයෙක් ද? එසේ ප්‍රකාශ කරන්නේ කිනම් කරුණු මත ද?

5. ඉහත සිද්ධියට අනුව රංජිත්ගේ ව්‍යාපාරයේ මුදල් ගලාඒමක් හා මුදල් ගලායෑමක් සඳහන් කරන්න.

(ලකුණු 2ඃ5=10)

04. 1. රෝහල, ස.තො.ස, පාසල, කාගිල්ස්, ලංකා බැංකුව යන ව්‍යවසායකයන්,

    අ) ලාභ අරමුණු කරගත් ව්‍යවසායයන්,
    ආ) ලාභ අරමුණු කර නොගත් ව්‍යවසායයන්, යටතේ වර්ග කරන්න.

2. ව්‍යවසායකයකු විසින් සිදුකරන නිෂ්පාදනයක් සඳහා භාවිත කරනු ලබන ප්‍රධාන නිෂ්පාදන සාධක වර්ග හතර නම් කරන්න.

3. පහත සඳහන් එක් එක් නිදසුනකින් ප්‍රකාශ වන්නේ කුමන වර්ගයේ ව්‍යවසායකයෙක් ද?

    අ) සහල්, සීනි, පිටි ආදී පාරිභෝගික භාණ්ඩ විකිණීම-
    ආ) ඩෙංගු උවදුර නිර්මාණශීලී ලෙස මර්ධනය කිරීමට (වලක්වාලීමට) කටයුතු කරන පුද්ගලයින්-

4. ව්‍යාපාරිකයින් හා ව්‍යවසායකයන් අතර වෙනස පහත කරුණු යටතේ ඉදිරිපත් කරන්න.

    අ) ව්‍යාපාරික කටයුතු වල යෙදෙන ආකාරය-
    ආ) තරඟයට මුහුණදීම-

5. කුඩා පරිමාණ ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා රජයට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් ඔබ යෝජනා කරන්න.

(ලකුණු 2ඃ5=10)



පළාත

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**පළමු වාර පරීක්ෂණය - 2020**

**10 ශ්‍රේණිය**

ව්‍යවසායකත්ව අධ්‍යයනය

I පත්‍රය පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | **2** | 13 | **1** |
| 2 | **3** | 14 | **4** |
| 3 | **1** | 15 | **2** |
| 4 | **3** | 16 | **1** |
| 5 | **2** | 17 | **4** |
| 6 | **3** | 18 | **2** |
| 7 | **1** | 19 | **3** |
| 8 | **3** | 20 | **1** |
| 9 | **2** | 21 | **3** |
| 10 | **4** | 22 | **3** |
| 11 | **2** | 23 | **1** |
| 12 | **4** | 24 | **4** |
| | | 25 | **2** |

**(නිවැරදි පිළිතුරකට ලකුණු 2x25= මුළු ලකුණු 50)**

ව්‍යවසායකත්ව අධ්‍යයනය

II පත්‍රය පිළිතුරු

01. 1
- මිනිසා විසින් අනිවාර්යයෙන්ම සපුරාගත යුතු කායික හා මානසික තත්ත්වයන් -
- පුද්ගලයින්ට තම ජීවිතය පවත්වාගෙන යාමේදී අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු මූලික දෑ -
  උදා: ආහාරපාන, ඇඳුම්පැලඳුම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍ය

**(අදහස් දැක්වීම ප්‍රමාණවත්. ලකුණු 02)**

2.
- අත්‍යවශ්‍ය නොවීම
- විවිධ වීම
- නිර්මාණය කළ හැකිවීම
- සංකීර්ණ වීම
- අසීමිත වීම

**(කරුණු 02 ට ලකුණු 02)**

3.

| භාණ්ඩ | සේවා |
|---|---|
| • ස්පෘශ්‍ය වේ.<br>• භෞතික පැවැත්මක් ඇත.<br>• ගබඩා කළ හැකිය.<br>• සමජාතීය වේ.<br>• සපයන්නාගෙන් වෙන් කළ හැකිය. | • අස්පෘශ්‍ය වේ.<br>• භෞතික පැවැත්මක් නැත.<br>• ගබඩා කළ නොහැක.<br>• සමජාතීය නොවේ.<br>• සපයන්නාගෙන් වෙන් කළ නොහැකිය. |

**(වෙනස්කම් දෙකකට ලකුණු 02)**

4.
- පවතින දේ පිළිබඳව විමසිලිමත් වෙමින් වෙනසක් කිරීමට උත්සාහ දැරීම.
- අලුත් අදහස් හා සංකල්ප ක්‍රියාවට නැංවීමට උත්සාහ ගැනීම.
- අනාගතය වෙනස් කිරීමට පොළඹවන්නාවූ පුද්ගලයන්ගේ මානසික තත්වයන්.
- ව්‍යාපාර අදහසක් හඳුනාගෙන එය යම් ප්‍රායෝගික ව්‍යාපාර කටයුත්තක් බවට පරිවර්තනය කිරීමේ
  හැකියාව

**(ඉහත දක්වා ඇති ආකාරයේ අදහසකට ලකුණු 02)**

5.
- පවතින භාණ්ඩයක හෝ සේවාවක හෝ ක්‍රියාවලියක් නව ආකාරයෙන් ඉදිරිපත් කිරීම.
  උදා:- ස්වයං සේවා අලෙවි ක්‍රමය
- පවත්නා සංකල්පයකට සමානව නිර්මාණාත්මක නිපයුමක් බිහි වීම.
  උදා:- අයිස්ක්‍රීම් බෙදා හැරීමේ ජංගම රථ ක්‍රමයට, බේකරි නිෂ්පාදිත බෙදා හැරීම
- භාණ්ඩ වල මිශ්‍රණයක් භාවිතා කර නව නිපයුමක් ලෙස
  උදා :- LED විදුලි බල්බ යොදා වෙසක් තොරණ

**(පිළිගතහැකි ආකාරයේ වෙනස් පිළිතුරක් විය හැකිය. ලකුණු 02)**

6.
- නිර්මාණශීලීත්වය
- නවෝත්පාදනය
- අවදානම් භාරගැනීම
- අනාගත දැක්ම
- පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම
- සුභවාදීබව
- ස්වාධීනත්වය
- නම්‍යශීලීත්වය
- ආත්ම විශ්වාසය **(කරුණු දෙකකට ලකුණු 02)**

7.
- ආත්ම තෘප්තිය
- නිදහස
- සමාජ පිළිගැනීමකට යොමුවීම
- පිළිගැනිමකට ලක්වීම
- නායකත්වය හිමිවීම
- කීර්ති ප්‍රශංසා හිමිවීම
- ස්වාධීනව කටයුතු කිරීම
- සමාජ සුභසාධනයට දායකවීමෙන් මානසිකව ලබන සතුට **(කරුණු දෙකකට ලකුණු 02)**

8.
- අඩුආදායම්ලාභී පවුල්වල දරුවන්ට පොත්පත්, ඇඳුම්පැලඳුම්, පාසල් උපකරණ, ශිෂ්‍යත්ව, පාවහන් ආදී දේ ලබා දිම.
- හදිසි/ ස්වාභාවික විපත්වලදී උපකාරී වීම
  උදා: ආහාරපාන, ඖෂධ
- නිවාස අහිමිවූවන්ට නිවාස තනාදීම
- වැසිකිළි, කැසිකිළි ආදී දේ දිළිඳු පවුල්වලට සපයා දීම
- මාර්ග පිළිසකර කර දීම **(යනාදී ලෙස කරුණු දෙකකට ලකුණු 02)**

9.
- රැකියා අවස්ථා ජනනය වීම
- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වැඩිවීම මත ආර්ථික වෘද්ධියක් ඇති වීම
- දේශීය සම්පත් උපයෝජනය වීම
- විදේශ විනිමය ඉපයීමේ හැකියාව
- නව භාණ්ඩ හා සේවා වෙළෙඳපොළට පිවිසීම
- ආදායම්/ ධනය බෙදීයාමේ විෂමතාව අඩුවීම
- ප්‍රාදේශීය වශයෙන් සංවර්ධනය වේගවත් වීම
- ස්වයංපෝෂිත ආර්ථිකයක් බවට පත්වීම **(කරුණු දෙකකට ලකුණු 02)**

10.
- ව්‍යාපාරයට පදනම් වන භාණ්ඩ හෝ සේවාව කුමක්ද? යන්න
- ඉලක්කගත පාරිබෝගික කොටස ගැන
- ව්‍යාපාරයට කොතරම් කැපවිය හැකිද?
- ඉපයීම ප්‍රමාණවත්ද?
- ප්‍රාග්ධනය සපයා ගන්නා ආකාරය
- තරඟයේ ස්වභාවය
- සංවිධාන ක්‍රමය කුමක්ද? (තනිපුද්ගල, හවුල්....)
- ව්‍යාපාරය පිහිටුවන ස්ථානය?

**(ආදී ලෙස කරුණු දෙකකට ලකුණු 02)**

**(මුළු ලකුණු 2x10=20)**

02. 1. අ)
- කොම්පෝස්ට් පොහොර සෑදීම
- ප්‍රතිචක්‍රීකරණයට යොමු වීම

ආ)
- ජනතාව දැනුවත් කිරීම
- දේශීය ඖෂධ භාවිතාකර එම උවදුර මැඩපැවැත්වීමට නිෂ්පාදිතයක් බිහිකිරීම
- මදුරුවන් බෝ වීමට ඇති ඉඩකඩ වලකාලීමේ වැඩපිළිවෙලක්

**( (අ) හා (ආ) ලකුණු එක බැගින් ලකුණු 02)**

2.
- විශ්වාස හා ආකල්ප කෙරෙහි දැඩිව එල්බ ගෙන සිටීම
- මනෝවිහීතිය
- ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම
- තාර්කිකව කටයුතු නොකිරීම
- රීති හා සාම්ප්‍රදායන් අනවබෝධයෙන් පිළිගැනීම
- වැරදීම්/ විවේචනවලට බිහිවීම
- ප්‍රායෝගිකව කටයුතු කිරීමට බියවීම **(කරුණු දෙකට ලකුණු 02)**

3.
- ගැටළු අභියෝග ලෙස සලකා කටයුතු කිරීම
- විවිධ ආකාරයෙන් සිතා කටයුතු කිරීම
- අසාර්ථකත්ව ඉවසා කටයුතු කිරීම
- නිර්මාණශීලී පුහුණු අවස්ථාවලට සහයවීම
- නිර්මාණශීලීත්වය සඳහා පෙළඹවීම් සිදු කිරීම **(කරුණු දෙකට ලකුණු 02)**

4.
- ස්මාර්ට් ජංගම දුරකථනය
- LED රූපවාහිනිය
- ආරක්ෂිත කැමරා භාවිතය
- දුරකථන සංවාද හඬපට **(කරුණු දෙකට ලකුණු 02)**

5.
- දිගුවක් (උදාඃ- ස්වයං සේවා අලෙවි කිරීම)
- සංකලනයක් (උදාඃ- හාල්පිටි භාවිතයෙන් බේකරි නිෂ්පාදිත )
- අනුකරණය කිරීමක් **(නිදසුන සහිතව කරුණු දෙකට ලකුණු 02)**

**(මුළු ලකුණු 2x5=10)**

03. 1. සැලකිය හැකියි. (ලකුණු 01)

හේතු,
- දැක්මක් මත කටයුතු කිරීම
- නව්‍යතා කෙරෙහි යොමු වීම (ටැංකි නිර්මාණය කිරීම)
- නිර්මාණාත්මක චින්තනයකින් යුක්ත වීම **(කරුණකින් සනාථ කිරීම ලකුණු 01)**

2.
- නව්‍යතා සම්පාදනය/ නව තාවයෙන් කටයුතු කිරීමට යොමුවීම
- අඛණ්ඩ උත්සාහය
- කැපවීම
- සුභවාදීව සිතීම **(කරුණු දෙකට ලකුණු 02)**

3.
- ව්‍යාපාරය ලියාපදිංචි කිරීම
- සැලැස්මකට අනුව ව්‍යාපාර කටයුතු කිරීම
- අදාල ව්‍යාපාර කටයුතු කෙරෙහි දැනුමක් ඇති පාර්ශව හවුල්කර ගැනිම
- සහනදායී කොන්දේසි යටතේ ණය ලබා ගෙන ව්‍යාපාරය පුළුල් කිරීම

**(ආදී කරුණු දෙකකට ලකුණු 02)**

4. ව්‍යාපාර ව්‍යවසායකයෙක් **(ලකුණු 01)**

හේතුව,
- මිලදී ගැනීම හා විකිණීම සිදු කරන නිසා
- ආදායම්/ ලාභ ඉපයීමක් සිදු කරන නිසා **(කරුණු එකකින් සනාථ කිරීමට ලකුණු 01)**

5.
- මුදල් ගලා ඒම
  - මසුන් විකිණීම තුළින් **(ලකුණු 01)**
- මුදල් ගලා යෑම
  - මසුන් මිලදී ගැනීම
  - ටැංකි නිර්මාණය කිරීම **(කරුණු එකකට ලකුණු 01)**

**(මුළු ලකුණු 2x5=10)**

04. 1. අ) කාර්ගිල්ස්
ලංකා බැංකුව
ස.තො.ස

ආ) රෝහල
පාසල

**(නිවැරදි වර්ගීකරණ කර ඇත්නම් ලකුණු 02)**

2. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය **(කරුණු 04 ට ලකුණු 02)**

3. අ) ව්‍යාපාර ව්‍යවසායකයින්
ආ) සමාජීය ව්‍යවසායකයින් **(ලකුණු 02)**

4. අ) ව්‍යාපාරික කටයුතු වල යෙදෙන ආකාරය,

<u>ව්‍යාපාරිකයා</u>
- ගතානුගතික හා සාම්ප්‍රදායක ආකාරයට

<u>ව්‍යවසායකයා</u>
- පරිසරයේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නිර්මාණශීලී, නවෝත්පාදන පදනම් කරගෙන

ආ) තරඟයට මුහුණදීම,

<u>ව්‍යාපාරිකයා</u>
- තරඟයට මුහුණදීමට වැඩි කැමැත්තක් නොදක්වයි

<u>ව්‍යවසායකයා</u>
- තරඟය අභියෝගයක් ලෙස සලකා කටයුතු කරයි

**(වෙනස දැක්වෙන කරුණු දෙකට ලකුණු 02)**

5.
- සහනදායී කොන්දේසිය යටතේ ණය ප්‍රදාන කිරීමට මූල්‍ය ආයතන එකඟ කරවා ගැනීම
- නිෂ්පාදිත, රජය විසින් සාධාරණ මිලක් යටතේ මිලදී ගැනීම
- පොහොර අමුද්‍රව්‍ය, ආදි දේ කුඩා ව්‍යාපාරිකයින්ට අඩු මිලට සැපයීම

**(යනාදී කරුණු දෙකකට ලකුණු 02)**

**(මුළු ලකුණු 2x5=10)**